**කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව - 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට අයත් නොවන ඉදිකිරීම් සඳහා දරණ ලද ප්‍රාග්ධන වියදම් ස්ථාවර වත්කම් යටතේ දැක්වීම හේතුවෙන් ගොඩනැඟිලි වටිනාකම රු.1,505,717 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. | පිළිගනිමි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ නිමකළ බෝක්කු හා වෙනත් ප්‍රාග්ධන වත්කම් පිළිවෙළින් රු.1,279,297 ක් හා රු.3,684,692 ක් අඩුවෙන් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙනත් පුනරාවර්තන නොවන වියදම් සඳහා ලැබීම් (ප්‍රාග්ධන වියදම් ප්‍රදාන) ගිණුමේ ශේෂය රු.45,302,287 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.52,536,070 ක් ලෙස රු.7,233,783 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ක්ෂය හා අතිරික්තයේ ඌනතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.1,499,777 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. |
| (ඉ) | ඉකුත් වර්ෂයේදී සභා අරමුදලින් ක්‍රියාත්මක කළ රු855,908 ක ව්‍යාපෘති 04 ක් සඳහා බාහිර ආයතනවලින් ලැබී තිබුණු මුදල් විවිධ තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | | අදාළ මුදල් සභා අරමුදලට බැරකළ යුතුවේ. |
| (ඊ) | කැබිතිගොල්ලෑව පුස්තකාලය සතු වටිනාකම රු.1,695,393 ක්වූ පුස්තකාල පොත් සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | | සියළු වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වේ. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 04 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම් හා අනුරූපි වාර්තාවවල සඳහන් වටිනාකම් අතර රු.26,304,483 ක වෙනසක් විය. | පිළිගනිමි. | උපලේඛනවල වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.366,486,530 ක්වූ ගිණුම් විෂයය 03 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන් සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 1645 සහ 1646 වගන්ති | සභාවේ කාර්යයන් සහ ආදායම් ඉපයීමේ කාර්යයන් සඳහා ධාවනයේ යොදවා තිබුණු වාහන සහ යන්ත්‍ර 11 ක දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ 2015 වර්ෂයේ සිට සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අංක 3.1 වගන්තිය | සභාව සතු සක්‍රීය වාහන 04 ක ඉන්ධන දහන පරීක්ෂාවන් කර නොතිබුණි. | ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 වර්ෂයේ දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයභාරය ඉක්මවූ පුනරාවර්තන වියදම් රු.8,156,102 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අයභාරය ඉක්මවූ පුනරාවර්තන වියදම රු.34,496,972 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු රු.239,560 ක හිඟ කඩ කුලී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ii) | සභාව විසින් ටෙන්ඩර් බදු ලබාදී තිබූ ස්ථාන 15 කින් වසර 01 ත් 08 ත් කාලයක සිට අයවියයුතුව පවතින රු.3,995,589 ක හිඟ බදු කුලී හා තාවකාලික කඩ කාමර 21 කින් අයවිය යුතු රු173,250 ක හිඟ කඩකුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. වාහන කුලියටදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.1,113,621 ක් අයකර නොතිබුණි. | | |
| (ආ) | **බලපත්‍ර ගාස්තු** | | |
| (i) | පුද්ගලයන් 26 දෙනකුගෙන් අයකරගත යුතු රු.82,800 ක හිඟ ත්‍රී රෝද රථ නැවතුම්පළ ගාස්තු අයකරගෙන නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය නිසාය අයකර ගැනීමට නොහැකිවූ මුදල් 2022 වර්ෂයේදී අයකිරිමට කටයුතු කරමි. | අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ii) | යකාවැව ජල ව්‍යාපෘතියට අදාළව අයවිය යුතු හිඟ රු.102,183 ක ජල බිල්පත් හා හිඟ සම්බන්ධතා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ගාස්තු අය කර ගැනිමට කටයුතු සිදු කරමින් පවති. | අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තක්සේරු වටිනාකම රු.12,187,318 ක් වූ සභාව සතු වාහන 04 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අළුත්වැඩියා මට්ටමේ පවතින නමුත් එම වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු නොකර අනාරක්ෂිත ලෙස සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | පිළිගනිමි | මෙම වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනිමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | සභාව සතු වාහන 11 සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | පිළිගනිමි | වාහන සඳහා ආදායමේ බලපත්‍ර ලබා ගැනිමට කටයුතු කළයුතු වේ. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.3,768,818 ක් වූ වත්කම් වර්ග 11 ක් ඉකුත් වර්ෂ 06 ක කාලපරිච්ඡේදයක සිට නිශ්කාර්යව පැවතුණි. | පිළිගනිමි | අදාළ වත්කම් භාවිතය සඳහා කටයුතු කළයුතු වේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ එකතුවන ඝන අපද්‍රව්‍ය වර්ග කිරීමකින් තොරව එකතු කර කැබිතිගොල්ලෑව ප්‍රදේශයේ පවතින ලඳු කැලෑ ප්‍රදේශයකට බැහැර කර ගිනි තැබීම සිදු කරමින් පැවතුණි. | ඉදිරියේදි මෙම තත්ත්වය නිවැරදි කර ගැනිමට පියවර ගනිමි. | කසළ විධිමත්ව බැහැර කිරිමට හා කොම්පෝස්ට් නිෂ්පාදනය විධිමත් කිරිමට පියවර ගත යුතු වේ. |